# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1999/45 - 2016 දෙසැම්බර් මස 30 වැනි සිකුරාදා - 2016.12.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීම (සංශෝධන) පනතේ සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ගොනු අංකය* : GAL/LAN/ACQUIS/A13/20.
*ඉඩම් අමාත්‍යාංශ අංකය* : 4-3/9/2013/WS/688.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශ්‍යතාවය ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර*:

සබරගමු පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බෙලිගල් කෝරළේ නැගෙනහිර කොට්ඨාසයේ බිසෝවෙල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද කෑ 3519 හා 2016.12.07 දිනැති පිඹුර අනුව මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0151 ක් වූ ඉඩම් කොටස්:

1. කැබලි අංක 1
ඉඩමේ නම: බිබිලේ කුඹුර දැනට වත්ත ; හිමිකම් කියන අය: ආර්. ඒ. සුමනාවතී, අංක 39, බිසෝවෙල, ගලිගමුව නගරය; ප්‍රමාණය: හෙක්. 0.0147

2. කැබලි අංක 2
ඉඩමේ නම: බිබිලේ කුඹුර දැනට වත්ත ; හිමිකම් කියන අය: ආර්. ඒ. සුමනාවතී, අංක 39, බිසෝවෙල, ගලිගමුව නගරය; ප්‍රමාණය: හෙක්. 0.0004

ඉහත සඳහන් ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2017 ජනවාරි මස 25 වැනි දින පෙ. ව. 10.00 ට ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2017 ජනවාරි මස 18 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එම ඉඩම/පරවශ්‍යතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

කේ. ජී. එස්. නිශාන්ත,
ප්‍රාදේශීය ලේකම්,
ගලිගමුව.

ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය,
2016 දෙසැම්බර් මස 28 වැනි දින,

01 - 426

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1A - G 24795 - 17 - (2016/12)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.